අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2007 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2007

ඉතිහාසය I කොටස
History Part I

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා**

පැය එකයි
One Hour

මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි වන්නේ එයින් එකක් පමණි.
ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
මෙම කොටසට ලකුණු 40ක් ලැබේ.
I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 1 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දක්වා ඇත. ඒවා අතුරෙන් **එකක් පමණක්** කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නො ගැළපේ. එම නො ගැළපෙන** නම කුමක්ද'යි හඳුනාගෙන එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

1. (1) මහවොට් (2) මහවුටු (3) මහපුටු
(4) මාතෝට්ටම (5) මහාගාම (..........)

2. (1) දීපවංස (2) මහාවංස (3) සමන්තපාසාදිකා
(4) ධර්මප්‍රදීපිකා (5) වංසත්ථප්පකාසිනී (..........)

3. (1) මණිහිරවාපි (2) ඛානුවාපි (3) පත්තපාසානවාසි
(4) මහාදාරගල්ලවාපි (5) තිස්සවඩ්ඪමානකවාපි (..........)

4. (1) ලඤ්ජතිස්ස (2) සිරිනාග (3) ථූලත්ථන
(4) බල්ලාට නාග (5) වට්ටගාමණී (..........)

5. (1) සම්බනාර් කෝවිල (2) මුන්නේශ්වරම් කෝවිල (3) බැරැන්ඩි කෝවිල
(4) කන්දසාමි කෝවිල (5) තිරුක්කෝවිල් (..........)

6. (1) අල්බුකර්ක් (2) රයික්ලොෆ් ෆන් ගුන්ස් (3) යාන් ෂ්‍රොයිඩර්
(4) යාන් මාත්සුකර් (5) ෆන් අන්ජෙල්බෙක් (..........)

7. (1) මඩුගල්ල (2) නිකපිටිය බණ්ඩාර (3) ඇහැලේපොළ
(4) කැප්පෙටිපොළ (5) විල්බාවේ (..........)

8. (1) ජේම්ස් පීරිස් (2) ජේම්ස් ද අල්විස් (3) පොන්නම්බලම් අරුණාචලම්
(4) එච්. ජේ. සී. පෙරේරා (5) ඊ.ජේ. සමරවික්‍රම (..........)

9. (1) එච්. එස්. ඕල්කට් (2) එම්. සී. සිද්දි ලෙබ්බෙ (3) ආරුමුග නාවලර්
(4) සී. එච්. කැමරන් (5) අනගාරික ධර්මපාල (..........)

10. (1) 1840 ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (2) 1865 මහ නගර සභා පනත
(3) 1897 මුඩු බිම් පනත (4) 1931 බෞද්ධ විහාරගම් පිළිබඳ පනත
(5) 1935 ඉඩම් පනත (..........)

- අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්න සඳහා **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක** යුගලයක පද එකිනෙකට **නො ගැළපේ එම නො ගැළපෙන** යුගලය කුමක් ද'යි හඳුනාගෙන, ඊට අදාළ **අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත** ලියන්න.

11. (1) බුත්සරණ - ගුරුළුගෝමී
(2) සද්ධර්මරත්නාවලිය - ධර්මසේන හිමි
(3) යාල්පාන වෛපව මාලෙ - මයිල්වාක්නාපුල්වර්
(4) රසවාහිනී - වේදේහ හිමි
(5) පරෙවි සන්දේශය - ශ්‍රී රාහුල හිමි (..........)

Past Papers Wiki

12. (1) ථූපාරාමය - දේවානම්පිය තිස්ස රජු
(2) අභයගිරිය - වට්ටගාමණී අභය රජු
(3) ජේතවනය - මහාසේන රජු
(4) රංකොත් වෙහෙර - නිශ්ශංකමල්ල රජු
(5) ගඩලාදෙණිය - VI පරාක්‍රමබාහු රජු (...........)

13. (1) පළමුවන රාජසිංහ රජු - ටිකිරි බණ්ඩාර
(2) දෙවන රාජසිංහ රජු - ආස්ථාන කුමාරයා
(3) හයවන බුවනෙකබාහු රජු - සපුමල් කුමාරයා
(4) නවවන ධර්මපරාක්‍රමබාහු රජු - අම්බුළුගල කුමාරයා
(5) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු - කණ්ණසාමි (...........)

14. (1) ජොරිස් ෆන් ස්පිල්බර්ජන් - පළමුවැනි විමලධර්මසූරිය රජු
(2) සී බෝල්ඩ් ද චාට් - නරේන්ද්‍රසිංහ රජු
(3) රොබර්ට් නොක්ස් - ශ්‍රී විජය රාජසිංහ රජු
(4) ජෝන් පයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජු
(5) හ්‍යු බොයිඩ් - රාජාධි රාජසිංහ රජු (...........)

15. (1) කෝල්බෲක් කොමිසම - රාජකාරිය අවලංගු කිරීම
(2) මෝර්ගන් කොමිසම - ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව පිහිටු වීම
(3) ඩී. මියුරන් කොමිසම - සිවිල් සේවාව ආරම්භ කිරීම
(4) ඩොනමෝර් කොමිසම - සර්වජන ඡන්ද බලය
(5) සෝල්බරි කොමිසම - කැබිනට් ක්‍රමය (...........)

- අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නයක් සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **තිත් ඉර මත** ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | බදුල්ල වැම් ලිපිය | A | භික්ෂූන් සඳහා වූ උපදෙස් සහ නීති රීති |
| (ii) | මිහින්තලේ පුවරු ලිපිය | B | වෙළෙඳ නගරයක පාලනය සඳහා වූ නීති රීති |
| (iii) | වේවැල්කැටිය සෙල් ලිපිය | C | පාලකයන් දෙදෙනකු අතර වූ ගිවිසුමක් පිළිබඳ වාර්තාවකි. |
| (iv) | වෙස්සගිරි පුවරු ලිපිය | D | ජලය බෙදා දීම පිළිබඳ වාර්තාවකි |
| (v) | සංගමු විහාර ලිපිය | E | අධිකරණය පිළිබඳ නීති රීති |

(1) BDECA (2) BEDCA (3) BADEC (4) BDCEA (5) BAEDC (...........)

17.

| | X | | Y |
|---|---|---|---|
| (i) | වාජිරිය වාදය | A | දේවානම්පිය තිස්ස රජු |
| (ii) | දන්ත ධාතුව | B | පළමුවැනි සේන රජු |
| (iii) | කේශ ධාතු | C | ගජබා රජු |
| (iv) | පත්තිනි ඇදහීම | D | සිරිමේඝවණ්ණ රජු |
| (v) | බෝධි ශාඛාව | E | සිලාකාල රජු |

(1) BDECA (2) BEDCA (3) BADEC (4) BDCEA (5) BAEDC (...........)

18.

| | X | | Y |
|---|---|---|---|
| (i) | පණ්ඩුවාසු දේව රජු | A | සුමිත්‍රා දේවි |
| (ii) | වට්ටගාමණී අභය රජු | B | භද්‍රකච්චායනා |
| (iii) | පළමුවැනි විජයබාහු රජු | C | කල්‍යාණවතී |
| (iv) | නිශ්ශංකමල්ල රජු | D | තිලෝක සුන්දරී |
| (v) | පස්වැනි විජයබාහු රජු | E | සෝමා දේවි |

(1) BDECA (2) BEDCA (3) BADEC (4) BDCEA (5) BAEDC (...........)

19.

| | X | | Y |
|---|---|---|---|
| (i) | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | A | 1930 |
| (ii) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | B | 1802 |
| (iii) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | C | 1900 |
| (iv) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | D | 1890 |
| (v) | සමුපකාර දෙපාර්තමේන්තුව | E | 1912 |

(1) BDECA (2) BEDCA (3) BADEC (4) BDCEA (5) BAEDC (...........)

20.

| | X | | Y |
|---|---|---|---|
| (i) | රොබර්ට් බටුවන්තුඩාව | A | කම්කරු ඇමති |
| (ii) | සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර | B | පළාත් පාලන ඇමති |
| (iii) | ඩී. බී. ජයතිලක | C | ස්වදේශීය කටයුතු ඇමති |
| (iv) | ඩී. එස්. සේනානායක | D | අධ්‍යාපන ඇමති |
| (v) | පෙරිය සුන්දරම් | E | කෘෂිකර්ම ඇමති |

(1) BDECA (2) BEDCA (3) BADEC (4) BDCEA (5) BAEDC (...........)

- අංක 21 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් ........................................................................ 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ........................................................................ 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ........................................................................ 3 ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් ........................................................................ 4 ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .............................. 5 ද **තිත් ඉර මත** ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. |

21. **පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය සහ එහි පරිණාමය පිළිබඳ ව පහත දක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) දේවානම්පිය තිස්ස රාජ්‍ය සමයේ දී ක්‍රමානුකූල අභිෂේකයක් ස්ථාපිත වීම.
(B) කාශ්‍යප රජු රාජ්‍යත්වයට දේවත්වය ආරෝපණය කිරීම.
(C) ක්‍රි. පූ. පළමුවැනි සියවසේ ආරම්භයේ සිට ම රාජ්‍යත්වය විකාශනය කෙරෙහි හින්දු බලපෑම් ඇති වීම.
(D) අනුරාධපුර යුගයේ දී රාජ්‍යත්වයේ උරුමය පියාගෙන් පුතාට ලැබීම. (...........)

22. **ශාසන ඉතිහාසයෙහි ලා මහසෙන් රාජ්‍ය සමය වැදගත් වන්නේ පහත සඳහන් කවර ප්‍රතිචාරය / ප්‍රතිචාර මත ද?**
(A) වෛතුල්‍යවාදය හඳුන්වා දීම.
(B) අනුරාධපුරයේ විශාලතම ස්තූපය ඉදිකිරීමේ ගෞරවය හිමි වීම.
(C) අභයගිරි දාගැබ ඉදි කිරීම.
(D) ථෙරවාද බෞද්ධ ත්‍රිපිටකය ලක්දිවට ගෙන ඒම. (...........)

23. **වාරිමාර්ග පද්ධතියේ විකාශය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) විශාල වැව් කර වූ සිංහල රජුන් අතර පළමුවැන්නා වසභ රජු ය.
(B) ඇළහැර - මින්නේරි - කවුඩුළු - ජල සම්පාදන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ඉතිහාසයේ අලුත් යුගයකට මුල පිරූ සිද්ධියක් විය.
(C) කලාවැව නමැති විශාල වැව ඉදිකරන ලද්දේ මහසෙන් රජු විසිනි.
(D) පළමුවැනි විජයබාහු රජු මිණිපේ ව්‍යාපාරය ඉදි කළේ ය. (...........)

24. **ලන්දේසීන් හා මහනුවර රාජධානිය අතර පැවති 1766 ගිවිසුම සම්බන්ධයෙන් පහත සඳහන් කවර කාරණය / කාරණා නිවැරදි වේ ද?**
(A) මහනුවර රජුට කල්පිටිය වරාය භාරදීම.
(B) මහනුවර රාජධානියේ ක්‍රිස්තියානි ධර්මය පැතිරවීම ලන්දේසීන්ගේ අභිප්‍රාය වීම.
(C) කීර්ති ශ්‍රී රාජසිංහ රජු සහ විලෙම් ෆල්ක් ගිවිසුම අත්සන් කිරීම.
(D) ලන්දේසීන්ට වෙරළේ සිට සිංහල ගව්වක තීරයක් භාර දීමට මහනුවර රජු පොරොන්දු වීම. (...........)

Past Papers Wiki

25. **ශ්‍රීමත් තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරයාගේ පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) රාජකාරි ක්‍රමය නැවත ඇති කිරීම. (B) උඩරට රාජධානිය ආක්‍රමණය කිරීම.
(C) මුදලිවරුන්ගේ බලතල අඩු කිරීම. (D) ගම්සභා ක්‍රමය අහෝසි කිරීම. (...........)

- අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත** ලියන්න.

26. රාජ්‍ය පාලන මධ්‍යස්ථාන නිරිත දිගට සංක්‍රමණය වීමේ නිවැරදි අනුපිළිවෙළ දක්වෙන්නේ මෙයින් කවර ලැයිස්තුවේ ද?
(1) දඹදෙණිය, යාපහුව, ගම්පොළ, කුරුණෑගල, කෝට්ටේ (2) දඹදෙණිය, කුරුණෑගල, යාපහුව, ගම්පොළ, කෝට්ටේ
(3) දඹදෙණිය, කුරුණෑගල, ගම්පොළ, යාපහුව, කෝට්ටේ (4) දඹදෙණිය, ගම්පොළ, යාපහුව, කුරුණෑගල, කෝට්ටේ
(5) දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ (...........)

27. පළමුවන පරාක්‍රමබාහු රජුගේ දකුණු ඉන්දිය ආක්‍රමණය සඳහන් වන්නේ පහත සඳහන් කවර සෙල්ලිපියේ ද?
(1) තිරුවාලංගාඩු (2) දෙවනගල (3) ගල්විහාර
(4) අඹගමුව (5) පොත්ගුල් විහාර (...........)

28. ලංකාධිපත්‍යය (Conquest of Ceylon) නමැති ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.
(1) රිබෙයිරෝ (2) කේරෝෂ් (3) ද කුටෝ
(4) බැල්දියස් (5) බැරෝස් (...........)

29. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ දී පිහිටුවන ලද අවසාන පළාත කුමක් ද?
(1) ඌව පළාත (2) උතුරු මැද පළාත (3) සබරගමු පළාත
(4) වයඹ පළාත (5) දකුණු පළාත (...........)

30. දහනවවැනි සියවසේ හින්දු පුනරුදයේ පුරෝගාමියා කවරෙක් ද?
(1) ජී. ජී. පොන්නම්බලම් (2) සරවනමුත්තු (3) නටේෂ් අයියාර්
(4) ආරුමුග නාවලර් (5) මුතු කුමාරස්වාමි (...........)

- අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදාළ මාතෘකාවට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** කරුණ තෝරා, එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

31. **රජරට ශිෂ්ටාචාරයේ පිරිහීම සහ බිඳ වැටීම**
(1) චන්ද්‍රභානු ආක්‍රමණය (2) වාරිමාර්ග පද්ධතියේ බිඳ වැටීම
(3) කාලිංග සහ පාණ්ඩ්‍ය පෙළපත් අතර වූ ගැටුම් (4) දුර්වල පාලකයන්
(5) මාඝ ආක්‍රමණය (...........)

32. **යාපනය රාජධානිය**
(1) යාපනයේ පැරණි ඉතිහාසය හැදෑරීමට ප්‍රධාන මූලාශ්‍රය යාල්පාන වෛපව මාලෙ නමැති ග්‍රන්ථයයි.
(2) රාජධානියේ අගනගරය වූයේ නල්ලූර් ය.
(3) ආර්ය චක්‍රවර්ති රජවරු ඉතා බලවත් වූහ.
(4) ආර්ය චක්‍රවර්ති රජවරු ගම්පොළ රාජධානිය ආක්‍රමණය කළහ.
(5) අලකේශ්වර යාපනය රාජධානිය යටත් කළේ ය. (...........)

33. **විජයබා කොල්ලය**
(1) කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදී යෑම.
(2) කෝට්ටේ රාජ්‍යය තුළ මුස්ලිම් වෙළෙඳුන්ගේ බලය වර්ධනය වී යෑම.
(3) සීතාවක රාජ්‍යය බිහි වීම.
(4) කෝට්ටේ රජවරුන්ගේ බලය දුර්වල වී යෑම.
(5) මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි බලය වර්ධනය වීම. (...........)

34. කෝල්බෘක් - කැමරන් ප්‍රතිසංස්කරණ
(1) විධායක සහ ව්‍යවස්ථාදායක සභා පිහිටු වීම.
(2) නව අධිකරණ ක්‍රමයක් මුළු දිවයින තුළ ම ඇති කිරීම.
(3) සීමිත ඡන්දයෙන් නියෝජිතයින් තෝරා ගැනීම.
(4) සිවිල් සේවකයන්ගේ සංඛ්‍යාව අඩු කිරීම.
(5) මුළු දිවයිනට ම ඒකාබද්ධ පාලනයක් ඇති කිරීම. (...........)

35. **බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ වතු වගාව**

(1) බ්‍රිතාන්‍යයන්ගේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය සමඟ වතු වගාව වර්ධනය විය.
(2) ප්‍රවාහන ක්‍රමයේ සහ වතු වගාවේ වර්ධනය එකිනෙකට සම්බන්ධ විය.
(3) ජාත්‍යන්තර වෙළඳපොළ වතු වගාවේ වර්ධනයට දායක විය.
(4) හෙන්රි වෝඩ් විසින් ප්‍රථම කෝපි වත්ත ආරම්භ කරන ලදී.
(5) දකුණු ඉන්දියාවෙන් ලාභදායී ශ්‍රමය ලබා ගන්නා ලදී. (...........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගල දැයි තෝරා, අදාළ **අංකය තිත් ඉර මත** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු වැන්න මැනවින් පහදා දෙයි. |

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|
| 36. මහාතිත්ථයෙන් ගොඩබට මුල් ඉන්දු ආර්යයෝ මල්වතු ඔය සහ කලාඔය ඉවුරු ආශ්‍රිත ව ජනාවාස පිහිටුවා ගත්හ. | ගෝකණ්ණ වරායෙන් ගොඩබට ආර්ය කණ්ඩායම මහවැලි ගංගා ඉවුර ආශ්‍රිත ව ජනාවාස පිහිටුවා ගත්හ. | (...........) |
| 37. දිවයින එක්සත් කිරීමේ දුට්ඨගාමිණී රජුගේ කාර්යාවලියට අඩිතාලම සකස්කරන ලද්දේ කාවන්තිස්ස රජු විසිනි. | කාවන්තිස්ස රජු යුද හමුදාවක් පිහිටුවා පුහුණු කොට යුද්ධායුධ තැනීම සඳහා කම්හල් ද පිහිටුවා ඒ ආයුධවලින් භටයන් සන්නද්ධ කොට මහවැලි ගඟ දිගේ වැදගත් ස්ථානවල ආරක්ෂක සේනාවන් නතර කරවී ය. | (...........) |
| 38. නිශ්ශංකමල්ල රජුගේ ඥාතීන්ට ප්‍රදානය කරන ලද වරප්‍රසාද පිළිබඳ ව පනාකඩුව තඹ සන්නසේ සඳහන් වේ. | නිශ්ශංකමල්ල රජු විසින් ගල්පොත ලිපිය පිහිටුවීමෙන් අදහස් කළේ වැසියන් පහදවා ඔවුන්ගේ සිත කාලිංග වංශයට අවනත කර ගැනීමට ය. | (...........) |
| 39. ශ්‍රී ලංකාවේ අවසාන සිංහල රජු වූයේ ශ්‍රී වික්‍රම රාජසිංහ ය. | II රාජසිංහ රජු පෘතුගීසීන් පලවා හැරීමට ලන්දේසීන් සමඟ 1638 දී ගිවිසුමක් ඇති කර ගත්තේ ය. | (...........) |
| 40. එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක 'සිංහල මහ සභාව' පිහිටුවිය. | පොන්නම්බලම් රාමනාදන් 'දෙමළ මහා , සභාව' පිහිටුවිය. | (...........) |

PAST PAPERS WIKI
PAST PAPERS WIKI

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2007 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2007

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය දෙකයි
Two Hours

10 වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න
ප්‍රශ්න අංක 10ට පිළිතුරු සැපයීම සඳහා ලංකාවේ දළ සිතියමක් සපයා ඇත

01. "ලක්දිව ආර්ය ජනාවාස පිහිටුවීම එක් අවස්ථාවක දී සිදු වූවක් නොව දීර්ඝ කාලයක් තිස්සේ සිදු වූවකි." සාකච්ඡා කරන්න. **(ලකුණු 14 යි)**

02. දේවානම්පිය තිස්ස රජුගේ පාලන සමයේ ආගමික හා සංස්කෘතික වැදගත්කම සාකච්ඡා කරන්න. **(ලකුණු 14 යි)**

03. අනුරාධපුර යුගයේ පසු භාගයේ දී ඇතිවූ දකුණු ඉන්දීය ආක්‍රමණ විචාරාත්මක ව විමසන්න. **(ලකුණු 14 යි)**

04. "මහා පරාක්‍රමබාහු රජුගේ අනුප්‍රාප්තිකයින් අතුරෙන් පොළොන්නරුවේ වැදගත් ම පාලකයා නිශ්ශංකමල්ල රජු ය."
   (i) නිශ්ශංකමල්ල රජුගේ රාජ්‍ය වංශය නම් කරන්න. **(ලකුණු 01 යි)**
   (ii) නිශ්ශංකමල්ල රජු විසින් කරවන ලද ගොඩනැගිලි තුනක් නම් කරන්න. **(ලකුණු 03 යි)**
   (iii) නිශ්ශංකමල්ල රජුට මුහුණපෑමට සිදු වූ අභියෝගයන් මොනවා ද? **(ලකුණු 04 යි)**
   (iv) "මහා පරාක්‍රමබාහු රජුගේ අනුප්‍රාප්තිකයින් අතුරෙන් පොළොන්නරුවේ වැදගත් ම පාලකයා නිශ්ශංකමල්ල රජු ය." යන කියමන විචාරාත්මක ව විමසන්න. **(ලකුණු 06 යි)**

05. (i) පෘතුගීසීන් උඩරට රාජ්‍යය ආක්‍රමණය කිරීමට තුඩුදුන් සාධක කවරේ ද? **(ලකුණු 07 යි)**
   (ii) එම ආක්‍රමණ අසාර්ථක වීමට හේතු පරීක්ෂා කරන්න. **(ලකුණු 07 යි)**

06. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය සම්බන්ධයෙන් ඇති වැදගත්කම පිළිබඳ ව පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** පිළිබඳ සටහන් ලියන්න.
   (i) අධිකරණ ක්‍රමය
   (ii) ආර්ථික ප්‍රතිපත්තිය
   (iii) ආගමික ප්‍රතිපත්තිය
   (iv) පරිපාලන ක්‍රමය
   **(එක් කොටසකට ලකුණු 07 බැගින්)**

07. දහනවවැනි සියවස තුළ උඩරට ගැමි ජනතාවගේ ජීවන තත්ත්වය කෙරෙහි වැවිලි කර්මාන්තය ඇති කළ ආර්ථික හා සමාජයීය බලපෑම් පරීක්ෂා කරන්න. **(ලකුණු 14 යි)**

08. බ්‍රිතාන්‍ය පාලනය යටතේ නියෝජන ක්‍රමය වර්ධනය වීමේ ප්‍රධාන අවස්ථා පැහැදිලි කරන්න. **(ලකුණු 14 යි)**


09. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** පිළිබඳ ව ඓතිහාසික සටහන් ලියන්න.
   (i) යාපහුව රාජධානිය
   (ii) දඹදෙණිය යුගයේ සාහිත්‍ය කටයුතු
   (iii) ආගමික පුනර්ජීවනය කෙරෙහි සරණංකර සංඝරාජ හිමිගේ දායකත්වය
   (iv) 1818 නිදහස් අරගලයට මුල් වූ හේතු
   (v) 1915 කෝලාහලය
   **(එක් කොටසකට ලකුණු 07 බැගින්)**

10. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම** ස්ථාන ලකුණු කර නම් කරන්න. ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.
   (i) පොළොන්නරුව (ii) නල්ලූර් (iii) අඹන් ගඟ (iv) කල්පිටිය
   (v) කලාවැව (vi) බලන (vii) රයිගම (viii) කතරගම
   **(නිවැරදි ව ලකුණු කොට නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි සටහනකට ලකුණු 05 බැගිනි)**

පැරණි ප්‍රශ්නපත්‍ර සංරක්ෂණ ව්‍යාපෘතිය නොමිලේ බෙදාහැරීම පිණිස පමණි
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
Past Papers Wiki

ප්‍රශ්න අංකය 10

විභාග අංකය.......................................................




WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library